**ත්‍රිකුණාමලය නගර සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට සහ 2009 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 30 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.2 **ගනුදෙනු, මෙහෙයුම් හා කාර්යය සාධනය පිළිබඳ අදහස් දැක්වීම.**

1.2.1 **බැංකු සැසඳුම්.**

මාස 06 කාල සීමාව ඉක්ම වූ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.117,986 ක් වටිනාකමැති චෙක්පත් 31 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.2.2 **ගෙවියයුතු ගිණුම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,294,558 ක් විය.

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2011 ජුනි 30 දින වන විට විගණන විමසුම් 60 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.77,106,218 ක් විය.

1.2.4 **අනුකූල නොවීම්.**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, වීධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත අංක 158(3) | නගර සභා ආඥා පනතේ 158(3) වගන්තිය ප්‍රකාර සියලු ලැබීම් බැංකු ගිණුමෙහි තැන්පත් කළයුතුය. එසේ වුවද2010 මාර්තු 01 සිට 2010 මාර්තු 31 දින දක්වා ලැබීම් රු.360,840 ක් බැංකුගත නොකර, දිනපතා ගෙවීම් සඳහා භාවිතා කර තිබුණි. |
| (ආ) | නගර සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) | Iv පරිච්ඡේදයේ 126 ඡේදය | සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් වවුචර් සභාපතිවරයා විසින් සහතික කර නොතිබුණි. |

(ii) Iv පරිච්ඡේදයේ 131 ඡේදය — වියදම් සඳහා යොමුව, අයවැය ප්‍රතිපාදන, වියදම, දිනය හා ශේෂය යනාදි සියලු තොරතුරු ඇතුළත් නොකර, ගෙවීම් වවුචර් පිළියෙළ කර තිබුණි.

(iii) X පරිච්ඡේදයේ 227 ඡේදය — සභාවේ නිලධාරීන් විසින් ලබා ගත් නිවාඩු පිළිබඳ වාර්තා අර්ධ වාර්ෂිකව සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

මුදල් රෙගුලාසි අංක 104 — පාඩු හා හානි වටිනාකම රු.300,000 ක අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.14.1

I. ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර, වාහන අලුත්වැඩියාව සඳහා රු.564,500 ක් ගෙවා තිබුණි.

II. ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර, ෆන්ගර් ස්කෑන් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා රු.167,272 ක් ගෙවා තිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>ආදායම් පරිපාලනය.</u>

#### 2.1.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම්.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය |
|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 45,804 | 8,245 | 10,664 | 11,244 | -- |
| (ii) | බදු කුළී | 18,910 | 2,707 | 51,750 | 10,804 | 6,281 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,547 | 1,296 | 251,420 | 2,970 | 2,718 |
| (iv) | වෙනත් ආදායම් | 3,634 | 3,173 | 459,927 | -- | -- |

#### 2.1.2 <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර, ප්‍රධාන ලේකම්, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.9,737,109 ක් වූ සභාවට ලැබියයුතු උසාවි දඩ මුදල් අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.1.3 මුද්දර ගාස්තු.

සමාලෝචිත වර්ෂයේදී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අය වියයුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.1.4 නොපිය වූ පළාත් පාලන, වැන්දඹු හා අනත්දරු දායකය රු.5,742,483

සමාලෝචිත වර්ෂයට අදාළව වැන්දඹු හා අනත්දරු දායකය රු.5,742,483 ක් මෙම වාර්තාවේ දින වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.

2.1.5 නොපිය වූ ජල සැපයුම් ගාස්තු රු.4,388,041

සභාවට ජලය සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට පියවියයුතු මුදලේ එකතුව රු.4,388,041 ක් වූ අතර, මෙම වගකීම වර්ෂ 1991 සිට පැවත එන්නකි.

2.1.6 හිඟ හිටි ජල ගාස්තු රු.193,073

1982 වර්ෂයේ සිට අය කර ගැනමට කටයුතු කර නොතිබුණු හිඟ හිටි ජල ගාස්තු 2010 දෙසැම්බර් 31 දිනට රු.193,073 ක් විය.

2.1.7 හඟ හිටි නිල නිවාස කුළිය

වර්ෂ 1997 සිට 2006 දක්වා හිඟ හිටි නිල නිවාස කුළිය රු.254,783 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.1.8 අය කර නොගත් වෙළඳ බලපත්‍ර ගාස්තු.

වර්ෂ 2006 සිට 2010 දක්වා හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.1.9 ත්‍රිකුණාමල නිවාඩු නිකේතන කුළිය.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුළියට ගන්නා ලද ත්‍රිකුණාමල නිවාඩු නිකේතනය සඳහා 1996 සිට 2007 දක්වා වූ කාලය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් අය වියයුතු බදු කුළිය රු.4,565,275 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 72,084 | 73,683 | (1,599) | 71,300 | 68,370 | 2,930 |
| අනෙකුත් | 31,436 | 17,499 | 13,937 | 28,826 | 23,835 | 4,991 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උප එකතුව | 103,520 | 91,182 | 12,338 | 100,126 | 92,205 | 7,921 |
| ප්‍රාග්ධන වියදම | 11,732 | 2,752 | 8,980 | 9,566 | 3,836 | 5,730 |
| මුළු එකතුව | 115,252 | 93,934 | 21,318 | 109,692 | 96,041 | 13,651 |

2.3 අධිභාර.

නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) යටතේ වගකිවයුතු අයවලුන්ට එරෙහිව ම විසින් පනවන ලද අධිභාර අනුව, 2010 දෙසැම්බර් 31 දිනට අය කර ගැනීමට තිබුණ අධිභාර අගය රු.4,027,857 ක් විය.

2.4 මානව සම්පත් කළමණාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 03 | 01 | 02 |
| ද්විතියික | 53 | 39 | 14 |
| ප්‍රාථමික | 205 | 171 | 34 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 105 | (105) |
| | 261 | 316 | (55) |

2.5 වත්කම් කළමනාකරණය.

2.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

විගණනයේ දි හදුනා ගත් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම රු. | ඌන උපයෝජිතව පැවති කාල සීමාව |
|---|---|---|
| වෙළඳ ගොඩනැගිල්ල | 10,000,000 | වර්ෂ 19 |
| වාහන 08 ක් | 1,600,000 | වර්ෂ 02 |
| සේවා නොකළ යන්ත්‍ර 12 ක් | 3,096,000 | වර්ෂ 02 |

2.5.2 ලැබියයුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,175,340 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,048,246 ක් විය.

2.5.3 අය වීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.10,411,257 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5.4 **සමීක්ෂණය නොකළ වත්කම්.**

භෞතික සමීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.67,379,865 ක් විය.

2.6 **වාහන උපයෝජනය.**

2.6.1 **ඉන්ධන පරිභෝජනය.**

වාහන ධාවන සටහනේ සඳහන් ධාවනය කළ කිලෝ මීටර් ගණන සහ මීටරයේ සඳහන් සත්‍ය කිලෝ මීටර් ගණන අතර වෙනසක් පැවතුණි. තොරතුරු පහත දැක්වේ.

| වාහන අංකය | දිනය | ධාවන සටහන අනුව ධාවන දුර | මීටරයට අනුව සත්‍ය ධාවන දුර | වෙනස |
|---|---|---|---|---|
| | | **කි.මී.** | **කි.මී.** | **කි.මී.** |
| WPJE-9328 | 2010.01.21 | 70 | 14 | 56 |
| WPJE-5262 | 2010.06.22 | 94 | 84 | 10 |
| WPJE-5262 | 2010.06.24 | 68 | 63 | 05 |

2.7 **අවිධිමත් ගනුදෙනු.**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, සහ කාර්මික ඉංජිනේරුවරයාගෙන් වාර්තා ලබා නොගෙන, නගර සභාවේ වාහන අලුත්වැඩියා සඳහා රු.564,500 ක් ගෙවා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, ටයර් මිල දී ගැනීම සඳහා රු.561,600 ක් ගෙවා තිබුණි. තව ද, මිල දී ගත් අයිතම ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) දිනපතා රැස් කිරීම් බැංකුගත කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඈ) පළාත් පාලන සතිය සැමරීම සඳහා රු.231,482 ක වියදම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තව ද, 2010 ඔක්තෝබර් 20 දිනැති

අංක PL/7/10/5 දරන චක්‍රලේඛයේ උපදෙස් ද අනුගමනය කර නොතිබුණු බව ද නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, රු.167,272 කට ඇහිලි සළකුණු යන්ත්‍රයක් මිල දී ගෙන තිබුණි. තව ද, මෙම යන්ත්‍රය ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ද ඇතුළත් කර නොතිබුණු බව විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

2.8 **ආර්ථිකමය නොවූ ගනුදෙනු.**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සභාවේ ස්ථිර කාර්යය මණ්ඩලයට මුරකරුවන් ඇතුළත් වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික ආරක්ෂක සෙවා ආයතනයක සේවාව ලබා ගැනීම වෙනුවෙන් රු.2,066,643 ක් ගෙවා තිබුණි.

(ආ) රු.167,272 කට ඇහිලි සළකුණු යන්ත්‍රයක් මිල දී ගෙන තිබුණ ද, සභාව එම යන්ත්‍රය භාවිතා කර නොතිබුණි.

2.9 **අභ්‍යන්තර විගණනය.**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය